ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூக பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
**Ministry of Rural Development, Social Security and Community Empowerment**
01වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල. 01ஆம் மாடி, கட்டம்II, செத்சிறிபாய, பத்தரமுல்லை. 01st Floor, Stage II, Sethsiripaya, Battaramulla

| | | |
|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No : MRDSS&CE/02-01/10/04 | ඔබේ අංකය. / உமது இல. / Your No. | දිනය. / திகதி / Date 2025.11. 24 |

චක්‍රලේඛ අංක 4/2025 (I)

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්**
**සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්**

**<u>ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය සඳහා සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීම.</u>**

ආර්ථික ප්‍රතිලාභ තුලින් සමාජ සවිබලගැන්වීම් සඳහා වන ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය සඳහා ආර්ථික සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීම මැයෙන් 2025.09.22 දින මවිසින් නිකුත් කරන ලද 4/2025 චක්‍රලේඛය කෙරේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයෙහි 1:1 මඟින් මේ වන විට ග්‍රාම නිලධාරී කොට්ඨාශ සඳහා අනුයුක්තව කටයුතු කරන ආර්ථික සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කිරීමෙන් පසු වෙනත් අමාත්‍යාංශ/ආයතන යටතේ සේවය කරන නිලධාරීන් ස්ථාන මාරු කර අනුයුක්ත කර ගත හැකි බවට දක්වා ඇත.

03. නමුදු එවකට ආර්ථික සංවර්ධන නිලධාරීන් නමින් හැඳින් වූ නිලධාරීන් මේ වන විට වෙනත් අමාත්‍යාංශ/ ආයතන වෙත ස්ථාන මාරු ලැබ ඇති බැවින් රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි සංවර්ධන නිලධාරීන් එම රාජකාරී සඳහා ග්‍රාම නිලධාරී වසම් වලට අනුයුක්තව රාජකාරී ඉටු කරයි.

04. මෙම තත්ත්වය මත ප්‍රජා සවිබලගැන්වීමේ නිලධාරීන් අනුයුක්ත කිරීමේදී බාධාවන් ඇති බවට නිරීක්ෂණය වූ බැවින් ඒ සඳහා නැවත අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබා ගැනීමට කටයුතු කරන ලදී.

05. ඒ අනුව අංක 25/2110/816/060-1 හා 2025-11-17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව පහත පරිදි කටයුතු කරන ලෙසට සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දැනුම් දෙනු ලැබේ.

* 2025.08.10 වන විට ග්‍රාම නිලධාරී කොට්ඨාස වලට අනුයුක්තව සිටි රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ වූ සංවර්ධන නිලධාරීන් ද එම ග්‍රාම නිලධාරී වසම් සඳහා ප්‍රජා සවිබලගැන්වීම් නිලධාරී ලෙස අනුයුක්ත කරනු ලැබේ.

* උක්ත පරිදි කටයුතු කිරීමේදී මාගේ 2025.09.24 ලිපිය මඟින් දක්වා ඇති අදාල ඇමුණුම් 03 හි සංශෝධන වේ නම් නැවත සකසා 2025.11.30 දිනට ප්‍රථම අමාත්‍යාංශයේ මේ වන විටත් ඔබ වෙත ඉදිරිපත් කර ඇති Google සබැඳියට එක් කිරීම.

06. එමෙන්ම අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ග්‍රාම නිලධාරී වසම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා නිලධාරී අනුයුක්ත කිරීමෙන් පසු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල අතිරික්ත වන නිලධාරීන් සෙසු පුරප්පාඩු පවතින ග්‍රාම නිලධාරී කොට්ඨාස, ප්‍රාදේශීය ලේකම් කාර්යාල

...ම් /செயலாளர்/Secretary:011-2883525 011-2187007 rdsscesecretary@sltnet.lk www.stateminsamurdhi.gov.lk
...ාලය/ அலுவலகம்/Office: 011-2887349-51

හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කිරීමටත් එලෙස අනුයුක්ත කිරීමට අපොහොසත්ව තවදුරටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල අතිරික්ත වන්නේ නම් එම නිලධාරීන් නැවත රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත අනුයුක්ත වේ.

07. ඒ අනුව 2025.12.25 දින වන විට 2026 වසරේ මෙම අමාත්‍යාංශය යටතේ වැටුප් ලබන නිලධාරීන් නිශ්චිත වශයෙන් හඳුනා ගත යුතුව ඇත.

08. එමෙන්ම මෙම අවස්ථාවේ එම නිලධාරීන්ගේ ස්ථාන මාරු කිරීම් 2026.01.01 දින දක්වා අත්හිටුවන බවද කාරුණිකව දන්වමි.

09. මගේ සමාංක හා 2025.10.24 දිනැතිව නිකුත් කර ඇති ලිපිය මින් අවලංගු කරනු ලැබේ.

සම්පත් මන්ත්‍රීනායක
ලේකම්

පිටපත :
1. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
2. අධ්‍යක්ෂ ජනරාල්, ප්‍රජාශක්ති ලේකම් කාර්යාලය - කරු.දැ.ගැ.ස.